# වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

### අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

ආසියානු මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් සහනදායි ණය පහසුකම් සමග සහ ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලබන ප්‍රතිඛණ්ඩ අරමුදල් මගින් වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනෙහි ප්‍රධාන සැලැස්මේ කොටසක් වන, 2024 වසර වන විට සම්පූර්ණ කරලීමට බලාපොරොත්තු වන වැඩ සටහනකි.

**අයදුම්පත්**

කොන්ත්‍රාත් පදනම මත වන පහත සඳහන් තනතුර සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් තම අධ්‍යාපනික වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළත් ජීවදත්ත ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2021.08.05 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ "**අයදුම් කරන තනතුර**" සඳහන් කළ යුතුය.

**වැඩසටහන් අධ්‍යක්ෂ**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**
**නො. 493-1/1, ටී. බී. ජයා මාවත,**
**කොළඹ - 10.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, කුසලතාව මත තෝරා ගැනීම සිදු කෙරේ. එම නිසා යම් බලපෑම් හෝ බඳවා ගැනීමේ ක්‍රියාදාමයට නියෝජනයන් සිදු කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත. මූලික සුදුසුකම් තහවුරු කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු අතර, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. රාජ්‍ය සේවයේ/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ සංස්ථා සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානීන් අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් පූර්ණ කාලීන පදනම මත ඔවුන් නිදහස් කළ හැකි බව දන්වා සිටිය යුතුය.

| තනතුරු හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **මානව සම්පත් නිලධාරී වැඩසටහන් කළමනාකරණ ඒකකය - කොළඹ**<br>**තනතුරු 01 යි (PS 05)**<br>**රැකියා පැතිකඩ**<br>නියෝජ්‍ය වැඩසටහන් අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන PMU-PD) සහ මාර්ගෝපදේශ යටතේ MWISP හි වැඩසටහන් කළමනාකරණ ඒකකයේ ඵලදායී හා කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රියාදාමයන් නඩත්තු කිරීම/ පවත්වාගෙන යාම.<br>■ MWISP වැඩසටහනට සේවකයින් බඳවා ගැනීමට MWISP කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීමට සහාය වීම සහ නිවාඩු වැටුප් වර්ධක, EPF හා ETF කරුණු, විනය කටයුතු සේවා අත්හිටුවීම් යනාදියට ඉදිරිපත්වීම.<br>■ කළමනාකරණ සහකරුවන් සහ සහායක කාර්යය මණ්ඩල අධීක්ෂණය කිරීම<br>■ PMU කාර්ය මණ්ඩලයට සේවා පහසුකම් ලබාදීම.<br>■ වාරිමාර්ග අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වැනි අදාළ නියෝජිතායතන හා සමග ඵලදායී පරිපාලන සබඳතා පවත්වාගෙන යාම. | පහත සඳහන් සුදුසුකම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 0/2019 හා සමග අනුකූල වේ.<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධිය<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්<br>හෝ<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ කාර්මික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට අඩු නොවන නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම<br>සහ<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩු තරමින් වසර 06 ක පළපුරුද්ද.<br>2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අඩු නොවන නිපුණත්වය පිළිබඳ සහතියක් ලබා තිබීම.<br>සහ<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩු තරමින් වසර 11 ක පළපුරුද්ද<br>3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමින් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ කාර්මික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට අඩු නොවන නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩු තරමින් වසර 16 ක පළපුරුද්ද<br>වැටුප් මට්ටම :<br>PS-5- රු. 105,000.00 - රු. 113,000.00 |

ඉහත විස්තර කොට ඇති වැටුපට අමතරව MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු අය විය යුතුය.
2. අදාළ රජයේ ආයතන හා වෙනත් නියෝජිතායතන සමග සහසම්බන්ධීකරණයෙන් සියලුම නිලධාරීන් තම රාජකාරී ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.
3. ශ්‍රී ලංකාව තුළ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියකි.
4. ඉංග්‍රීසි භාෂා නිපුණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ මනා දැනුම හා පරිගණක සාක්ෂරතාව මෙම තනතුරු සඳහා අත්‍යාවශ්‍ය පූර්ව අවශ්‍යතා වේ.
5. රැකියා කොන්ත්‍රාත්තු, කාර්ය සාධනය හා වැඩසටහන්හි/ ව්‍යාපෘතිවල අවශ්‍යතාව මත පදනම්ව වාර්ෂිකව නැවත අලුත් කළ හැකි පරිදි එක් වසරක කාලයක් සඳහා
6. රජයේ අනුමත දීමනා සමග වැටුප් පරිමාණ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හා ඉන්පසු යම් සංශෝධනයන්ට අදාළ පරිදි වේ. (http://www.treasury.gov.lk)

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය**